# දිස්ත්‍රික් ලේකම්තුමන්ගෙන්

වයඹ පළාතට  දිස්ත්‍රික්ක දෙකක් අයත් වන අතර ඉන් පුත්තලම් දිස්ත්‍රික්කය ඉතා ඈත ඉතිහාසයකට හිමිකම් කියයි. සිංහලයේ මුල්ම රජු වූ විජය කුමරු ලංකාවට ගොඩ බසින ලද්දේ මෙම දිස්ත්‍රික්කයේ තම්බපන්නී ප්‍රදේශයෙනි. මෙයින් පෙනී යන්නේ සිංහලයේ ආරම්භය සිදු වුයේ මෙම දිස්ත්‍රික්කයෙන් බවයි.

ව.කි.මී.3,072ක් පමණ වූ භූමි ප්‍රමාණයක් මෙම දිස්ත්‍රික්කයට අයත්වේ. සිංහල, දෙමළ, මුස්ලිම් මෙන්ම ජා, පරංගි, චෙට්ටි, මලයාල, කාපිරි ආදි විවිධ ජන කොටස් මෙහි ජීවත්වේ. බෞද්ධ හා හින්දු ආගමික බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ මුන්නේශ්වරම් කෝවිල ද, කතෝලික බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ තලවිල ශාන්ත ආනා දෙව් මැදුර ද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා තිබීම සුවිශේෂී වැදගත් කරුණකි..

නීල බැම්ම, රදවි බැඳි ඇල, ඉඟිණිමිටිය වැනි ජලාශ මෙම දිස්ත්‍රික්කයේ කෘෂි කර්මාන්තය පෝෂණය කරයි. වෙන්නප්පුව සිට කල්පිටිය තෙක් දිවෙන සමුද්‍ර තීරය ධීවර කර්මාන්තයද සාර්ථකව සිදු කිරීමට පිටුවහලක් වී ඇත.  එසේ ම, පුත්තලම කලපුව හේතුවෙන් ලුනු කර්මාන්තයටද මෙම දිස්ත්‍රික්කය ප්‍රසිද්ධියක් උසුලයි.

පුත්තලම් දිස්ත්‍රික්කය ඉතාමත් දුෂ්කර වුත් ගොවිතැන ජීවන වෘත්තිය කරගත් ජනතාවක් වෙසෙන්නා වුත් දිස්ත්‍රික්කයක් ලෙස හැඳින්වුව ද අද මෙම තත්ත්වය ක්‍රමයෙන් වෙනස් වෙමින් පවතී. කෘෂිකර්මාන්තයත්, ධීවරකර්මාන්තයත් වෙනුවට සංචාරක කර්මාන්තය,විදුලිබල නිෂ්පාදනය වැනි ක්ෂේත්‍ර මෙම දිස්ත්‍රික්කයට අලුතින් එකතු වූ කර්මාන්ත ලෙස හැඳින්විය හැකිය.. අධ්‍යාපන අතින් දියුණු වන අතරම නොරොච්චෝල තාප බලාගාරයත්, සුලං බලාගාරයත්, සංචාරක ව්‍යාපාරයත් කොළඹ සිට යාපනය තෙක් දිවෙන මහා මාර්ගයත් හේතුවෙන් මෙම දිස්ත්‍රික්කය සීඝ්‍ර සංවර්ධනයට පත්වෙමින් පවතින බව පෙන්වා දීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

දිස්ත්‍රික්කයේ පරිපාලනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 මගින් සිදු කෙරේ. දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන එමින් දිස්ත්‍රික්කයේ සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන සියළුම වැඩසටහන් වලට දායකත්වය ලබාදීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින්  සිදු කරනු ලබයි.

2012 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16ක් මගින් දිස්ත්‍රික්කයේ සාමාන්‍ය පරිපාලන කටයුතු , සමාජ සේවා හා සංස්කෘතික වැනි විවිධ අංශයන් ඔස්සේ ඉටුකර ඇති සංවර්ධන සේවාවන් හා ඒ සඳහා වැය කළ මුදල් පිළිබඳ ප්‍රගතිය දැක්වෙන ලේඛනයක් ලෙස මෙම පොත හැඳින්විය හැක.

එම්.කිංස්ලි ප්‍රනාන්දු

දිස්ත්‍රික් ලේකම්

පුත්තලම

## දැක්ම

භෞතික හා මානව සම්පත් ඵලදායි හා කාර්යක්ෂමව මෙහෙයවමින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට යහපත් ජීවන තත්වයක් ලඟා කරදිම

## මෙහෙවර

දිස්ත්‍රික්කය තුල තිරසාර වු සංවර්ධන ක්‍රියාවලියක් තහවුරු කරනු වස් ,ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව,යුක්තිගරුකව සහ මිත්‍රශීලීව ඉටු කිරිම සඳහා භෞතික සම්පත් ඵලදායි ලෙස මෙහෙයවිම හා සම්බන්ධීකරණය කිරිම

## தொலைநோக்கு

பௌதீக மற்றும் மனித வளங்களை பயனுடைய விதத்தில் வழி நடாத்துவதன் மூலம், மாவட்டத்தில் வாழும் மக்களின் வாழ்க்கை தரத்தை மேம்படுத்தல்.

## செயற்பணிப் பிரகடனம்

மாவட்டத்தின் வலுவாதார அபிவிருத்தி நடவடிக்கைகளை முன்னிறுத்தி நிறுவனங்களையும், வளங்களையும், பயனுடைய விதத்தில் வழி நடாத்தும் ஒரு கூட்டமைப்பின் மூலம் மக்களின் தேவைகளை வினைத்திறனுடனும், நீதியாகவும், நேர்மையாகவும், நட்புறவுடனும் நிறைவேற்றல் எங்கள் பணியாகும்.


## Vision

Our vision is to uplift the living standard of the District people through successfully harnessing the physical and human resources.

## Mission

Our mission is to fulfill the community's need through efficient, equitable, just and cordial services, successfully harnessing the resources and the institutions with proper guidance and coordination, conducive to sustainable development activities of the district.

<u>දිස්ත්‍රික් සිතියම</u>



## හැඳින්වීම

ලාංකික වංශ කථාවේ නිජ භූමිය වූ පුත්තලම (තම්බපණ්ණි) දීර්ඝ ඉතිහාසයක් ඇති භූමි භාගයකි.පුත්තලම් දිස්ත්‍රික්කය මුහුදු මට්ටමින් අඩි 300 අඩු උසකින් පිහිටි බිම් තීරුවකි.උතුරින් කලා ඔයටද,නැගෙනහිරින් කුරුණෑගල දිස්ත්‍රික්කයටද,දකුණෙන් මා ඔයෙන්ද,බටහිරින් ඉන්දියන් සාගර වෙරළ තීරයෙන්ද සීමා වී පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කය පිහිටා ඇත.දිස්ත්‍රික්කය තුල වැඩිම දිග කි.මී.120 වන අතර පලල කි.මී.50 පමණ වේ.

දිගින් කි.මී. 288 ක් වූ වෙරළබඩ තිරයෙන්ද අභ්‍යන්තර ජල පෝෂිත ප්‍රදේශ සමඟ ව.කි.මී.3072 භූමි ප්‍රමාණයක් මෙම දිස්ත්‍රික්කයට අයත් වේ.සිංහල,දෙමළ,මුස්ලිම් යන ප්‍රධාන ජන වර්ග 3 ට අමතරව මෙහි සුළු පිරිසක් ජා,පරංගි,හෙට්ටි,මලයාලි සහ දකුණු ඉන්දියානු සම්භවයකින් පැවත එන කාපිරි ආදි විවිධ ජන කොටස් දක්නට ලැබේ. බෞද්ධ, කතෝලික,ඉස්ලාමීය හා හින්දු යන බහු ආගමිකයන් වෙසෙන මෙම දිස්ත්‍රික්කයේ බහුතරය සිංහල බෞද්ධයෝය.සිංහල කතෝලික වැඩි ජනතාවක් වෙරළාසන්න ප්‍රදේශ වල ජීවත් වේ.

දිස්ත්‍රික්කය පුරා දේශගුණික කලාප තුනක් දැකිය හැක.දැදුරු ඔය සිට මා ඔය තෙක් තෙත් කලාපීය ලක්ෂණද,දැදුරු ඔය සිට උතුරු සීමාව තෙක් වියළි ශුෂ්ක ලක්ෂණද,කල්පිටිය අර්ධද්වීපයට අයත් උතුරු වයඹ දිග කොටස ශුෂ්ක වැලි බිම් තීරුවකින්ද සමන්විත වේ.

## ඓතිහාසික වැදගත්කම

ඉපැරණි ඉතිහාසයකට නෑකම් කියන ප්‍රදේශයක් වන පුත්තලම අතීතයේ මංගල තොටුපල ලෙස හැඳින්වූ බව ඉතිහාසගත වී ඇත.සිංහලයේ මුල්ම රජු වූ විජය කුමරු ලංකාවට ගොඩ බසින ලද්දේ පුත්තලම දිස්ත්‍රික්කයේ තම්බපණ්ණි ප්‍රදේශයෙනි.මෙයින් පෙනී යන්නේ සිංහලයේ ආරම්භය සිදු වූයේ මෙම දිස්ත්‍රික්කයේ බවයි.විජය කුමරු හට රජවීමට උපකාර කළ කුවේණිය සිටියේද මෙම ප්‍රදේශයේය.විජය කුමරු ඉන්දියාවෙන් වෙනත් කුමරියක ගෙන්වා ගැනීමෙන් පසු කුවේණිය හා දරුවන් පන්නා දැමීමෙන් පසු ඇය ජීවත් වූයේ තෝනිගල පරමාකන්ද ප්‍රදේශයේ බව ජනප්‍රවාදයේ පවතී.එම ප්‍රදේශයේ ලංකාවේ දිගම සෙල් ලිපිය පිහිටා තිබේ.තෝනිගල පිහිටියේ පුත්තලම දිස්ත්‍රික්කයට අයත් ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුලයි.

විජය රජු විසින් කුවේණිය හා දරුවන් පන්නා දැම්මෙන් පසුව ඇගේ නෑයන් වෙත යාමට පෙර ආරක්ෂාව පතා සිය දරුවන් තබා ඇත්තේ ආණමඩුව ප්‍රදේශයේම ධර්මපාලය නම් ස්ථානයේය.දරුවන් උන් පොල ධර්මපාලය වූ බව ජනප්‍රවාදවල පැවත එයි.ඈත යුගයේ මංගල තොටුපල නමින් හැඳින්වූ නමුත් පසු කාලයේදි පුදු+අලෙවි (අලුත් ලේවාය) යන දෙමළ වචනය සන්ධි වීමෙන් පුද්දලම් -පුත්තලම යනුවෙන් භාවිතයට පැමිණ ඇත.

දැනුදු ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් භාවිතා කරන කල්පිටිය ඕලන්ද බල කොටුව, දෙවන ලෝක යුද්ධ සමයේ භාවිතා කළ පාලවි ගුවන් තොටුපල ,ශ්‍රී ලංකාවේ ඉතිහාසයට සෘජුවම සම්බන්ධ වූ ස්ථානයන් ලෙස හැදින්විය හැක.වෙළද ද්‍රව්‍ය පුත්තලමට ගෙන ඒම සහ දේශීය නිෂ්පාදන කොළඹ වරායට ගෙනයාම බත්තල් හා පාරු මගින් ප්‍රවාහනය කිරිම සඳහා ලන්දේසි විසින් ඉදිකරන ලද පාරු ඇලෙන් තුනෙන් දෙකක් පමණ ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කය තුලය.ඈත අතීතයේ ලංකාවට ප්‍රසිද්ධියක් ගෙන ඒමට සාධකයක් වූ මුතුපර වෙරළ තීරයක්ද මෙම දිස්ත්‍රික්කයට අයත්වේ.

දුටු ගැමුණු රජතුමාගේ ප්‍රධාන ගෝලයකු වූ නන්දිමිත්‍රගේ ප්‍රාදේශීය පාලනයට යටත් වූ පල්ලම යන ප්‍රදේශයද මෙම දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වේ.හංසයන් පස් දෙනෙකුගෙන් යුත් හංස පූට්ටු වියන් සිතුවම් ඇත්තේ ආණමඩුව ප්‍රදේශයේ ඇති ඉපැරණි පරමාකන්ද රජ මහා විහාරයේය.බෞද්ධ හා හින්දු බැතිමතුන්ගේ ගෞරවයට පාත්‍ර වූ මුන්නේෂ්වරම් හින්දු කෝවිල මෙම දිස්ත්‍රික්කයේ හලාවත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල පිහිටා ඇත.එය දඹදෙනි රජ සමයේ මුනිසෝම ලෙස හැදින් වූ විහාරස්ථානය වේ යැයි මතයක් පවති.දැදුරු ඔය ප්‍රදේශයේ පිහිටි අයියනායක දේවාලය, මාදම්පේ තනි වැල්ලේ දේවාලය ඓතිහාසික වශයෙන් වැදගත් වේ.කතෝලික බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍ර වූ පැරණි සිද්ධස්ථානයක් වන තලවිල ශාන්ත ආනා දෙව් මැදුර මෙම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත.

චිත්‍ර කලාවෙන් මුළු ලෝකයේම අවධානයට යොමු වූ කැළණි විහාරයේ බිතුසිතුවම් ශිල්පි සෝලියස් මැන්දිස්,සිංහල සාහිත්‍ය කලාවේ දියුණුවට දායක වූ අතිගරු එඩ්මන්ඩ් පීරිස් රද ගුරුතුමා,සයිමන් නවගත්තේගම, විමලරත්න කුමාරගම යන කලාකරුවන්ද පුත්තලම දිත්‍රික්කයෙන් දැයට දායාද කර ඇත.

සීඝ්‍ර සංවර්ධනයට පත්වෙමින් පවතින මෙම දිස්ත්‍රික්කයේ වෙරළ තීරයට සමාන්තරව දිවෙන කොළඹ අනුරාධපුර මාර්ගය නිසා ප්‍රවාහන පහසුකම් අතින්ද ඉතා ඉහල මට්ටමක පවතින බව කිව හැකිය.

## ආර්ථික පසුබිම

පොල් ත්‍රිකෝණයට අයත් පුත්තලම දිස්ත්‍රික්කය පොල් ආශ්‍රිත අතුරු නිෂ්පාදන අපනයනය මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට දායකත්වයක් දක්වයි.එමෙන්ම අතීතයේ සිට පවතින වාරිමාර්ග පද්ධතිය නිසා වී ගොවිතැන මෙහි ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වී ඇත.මී ඔය හරස් කොට ඉදිකොට ඇති ඉගිණිමිටි ජලාශය ,තබ්බෝව ජලාශය,කොට්ටුකච්චිය ගොවිජනපදය නිසා මෙහි වී ගොවිතැන ඉතා ඉහල මට්ටමක පවති.කි.මී.150 දිගින් යුතු මුහුදු තීරයකින් සමන්විත වන මෙම දිස්ත්‍රික්කයේ කරදිය මත්ස්‍ය නිෂ්පාදනය බහුලව කෙරෙන අතර වැව් අමුණු ඔයවල් ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය කර්මාන්තය මගින්ද දේශීය ආර්ථිකයට විශාල මෙහෙවරක් කරනු ලබයි.වෙරළ තීරයක් සමඟ පවතින කලපු ජලාශ වල ඉස්සන් වගාවද කෙරෙන නිසා විදේශ විනිමයද

ලබාදෙයි.දූපත් කිහිපයකින් යුත් කල්පිටි ප්‍රදේශයේ ද,වනාතවිල්ලුව ප්‍රදේශයේ ද කරවල නිෂ්පාදනය පිළිබඳ විශාල ප්‍රසිද්ධියක් උසුලයි.ප්‍රධාන ලුණු ලේවාය පිහිටා ඇත්තේ පුත්තලම කලපුව ආසන්නවමය.

කල්පිටි ප්‍රදේශයේ භූගත ජලය උපයෝගී කර ගනිමින් සශ්‍රීක එළවළු වගාව සිදු කෙරේ.රතුලූණු,මිරිස්,දුම්කොළ මෙන්ම ගෝවා, බීට්රූට්, කැරට්, ගර්කින්, වට්ටක්කා, පැනි කොමඩු, තක්කාලි, ගස්ලබු , කිලෝ පේර, ඩ්‍රැගන් ෆෲට් වගා කිරීමෙන් කෘෂිකර්මාන්තයට දායකත්වයක් දක්වයි. ආරච්චිකට්ටුව, වනාතවිල්ලුව ප්‍රදේශවල කජු වගාවද පුත්තලම, කල්අඩිය, වනාතවිල්ලුව, රාල්මඩුව ප්‍රදේශවල ගස්ලබු, දොඩම් වගාවද දක්නට ලැබේ.

වනාතවිල්ලුව අරුවක්කාඩු ප්‍රදේශයේ හුනුගල් ස්වභාවික ඛනිජ සම්පත් නිධියක් පිහිටීම නිසා සිමෙන්ති කම්හලක් පුත්තලම ප්‍රදේශයේ ඉදි කොට ඇති අතර උළු මැටි ඛනිජ සම්පත් තිබෙන දංකොටුව හා වෙන්නප්පුව ප්‍රදේශවල උළු මැටි ආශ්‍රිත කර්මාන්ත හේතුවෙන් ඉදි කිරිම් ක්ෂේත්‍රයට විශාල දායකත්වයක් ලබා දී ඇත.

අප රටේ ප්‍රධාන අභය භූමි දෙකෙන් එකක් වන විල්පත්තු අභය භූමියද අධ්‍යාපන ක්ෂේත්‍රයේදී වැදගත් වන කුරුළු අභය භූමියක් ලෙස ප්‍රකාශිත ආනවිලුන්දාව කුරුළු පාරාදීසයද නිසා දෙස් විදෙස් සංචාරකයන් පැමිණීම හේතුවෙන් ඔවුන්ගේ සැප පහසුව සඳහා රන්වැලි,ඩොල්ෆින් ක්ලබ්,පාම්බේ වැනි සංචාරක හෝටල් ඉදිවී ඇති අතර කල්පිටිය බත්තලන්ගුණ්ඩු ප්‍රදේශයේ සංචාරක හෝටල් කිහිපයක් ඉදිවෙමින් පවතී.මේ නිසා පුත්තලම් දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තයෙන් රටේ ආර්ථිකයට මහත් පිටුවහලක් සැලසේ.

## දිස්ත්‍රික් පරිපාලන ව්‍යුහය

වයඹ පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකෙන් එකක් ලෙස පුත්තලම් දිස්ත්‍රික්කය හැදින්විය හැක.ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 මගින් දිස්ත්‍රික්කයේ පරිපාලනය සිදු කරනු ලබයි.

01.වෙන්නප්පුව

02.නාත්තන්ඩිය

03.හලාවත

04.ආරච්චිකට්ටුව

05.කල්පිටිය

06.පුත්තලම

07.වනාතවිල්ලුව

08.කරුවලගස්වැව

09.නවගත්තේගම

10.ආණමඩුව

11.මහකුඹුක්කඩවල

12.දංකොටුව

13.මාදම්පේ

14.පල්ලම

15.මුන්දලම

16.මහවැව

එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරි වසම් 548 ක්‍රියාත්මක කෙර්.ග්‍රාම සේවා වසම් වලට අයත් ගම් සංඛ්‍යාව 1273 කි.පුත්තලම දිස්ත්‍රික්කයේ 2012 වර්ෂයේ ජන්ද දායකයින් සංඛ්‍යාව පිරිමි 254,302 ක් වන අතර ගැහැණු 272,106 කි. පුත්තලම,හලාවත,ආණමඩුව,නාත්තන්ඩිය,වෙන්නප්පුව යනුවෙන් පුත්තලම් දිස්ත්‍රික්කය මැතිවරණ කොට්ඨාශ පහකට බෙදා ඇත.දිස්ත්‍රික්කයේ සියලු පක්ෂ වලින් තේරී පත්වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව පහත පරිදිවේ.

| | |
|---|---|
| පාර්ලිමේන්තු මන්ත්‍රීන් සංඛ්‍යාව | 08 |
| පළාත් සභා මන්ත්‍රීන් සංඛ්‍යාව | 17 |

දිස්ත්‍රික්කය තුල පළාත් පාලන ආයතන අතර නගර සභා 2 ක් හා ප්‍රාදේශීය සභා 10 ක් ඇති අතර ඒවාට සියළු පක්ෂ වලින් තේරී පත්වූ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව පහත දැක්වේ.

| පළාත් පාලන ආයතනය | මන්ත්‍රීන් සංඛ්‍යාව |
|---|---|
| පුත්තලම නගර සභාව | 09 |
| හලාවත නගර සභාව | 11 |

| | |
|---|---|
| පුත්තලම ප්‍රාදේශීය සභාව | 09 |
| කල්පිටිය ප්‍රාදේශීය සභාව | 14 |
| වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව | 10 |
| කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව | 10 |
| නවගත්තේගම ප්‍රාදේශීය සභාව | 09 |
| ආණමඩුව ප්‍රාදේශීය සභාව | 16 |
| ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව | 12 |
| හලාවත ප්‍රාදේශීය සභාව | 17 |
| නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව | 22 |
| වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව | 22 |


පුත්තලම හා හලාවත සංචාරක හා නිවාඩු නිකේතන දෙකක් ඇති අතර දිස්ත්‍රික්කය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 74 ක් පිහිටා තිබේ.මෙම දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන 16 මගින් දිස්ත්‍රික්කයේ සාමය හා ආරක්ෂාව සපයනු ලබයි.දිස්ත්‍රික්කය හලාවත හා පුත්තලම යනුවෙන් අධ්‍යාපන කලාප දෙකකට බෙදා ඇති අතර ඒ තුල පාසල් 348 ක් පිහිටා තිබේ.මෙම පාසල් වල ගුරුවරුන් 7643 ක් ඇති අතර සිසුන් සංඛ්‍යාව 159,155 කි. සාක්ෂරතා අනුපාතය 91.9% වන අතර මෙය ඉතා ඉහල අගයක් ගනී.

පුත්තලම් දිස්ත්‍රික්කයේ ජනගහනය 759,720 වන අතර මෙයින් පුරුෂ ජනගහනය 368,844 හා ස්ත්‍රී ජනගහනය 390,876 වේ.ශ්‍රී ලාංකික ජනගහනය හා බැලීමේදී පුත්තලම දිස්ත්‍රික්කයේ ජනගහන ප්‍රතිශතය 3.7% පමණ වන අතර ජනගහනය වැඩිවීමේ ප්‍රතිශතය 7% පමණ වේ.දිස්ත්‍රික්කයේ ජනගහනයෙන් 72% ක් සිංහල ද, 6% ක් දෙමළද, 19% ක් මුස්ලිම්ද, 0.2% බර්ගර් වන අතර 0.3% වෙනත් ජාතීන් වන බව ගණන් බලා ඇත.ළදරු මරණ හා මාතෘ මරණ අනුපාතය බලන විට අවම මට්ටමක පවතී.

# <u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය</u>

## <u>අනුමත කාර්ය මණ්ඩලය</u>

| කාණ්ඩය | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු/අතිරික්ත |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | - | | |
| තෘතීය මට්ටම | 54 | 37 | 17 |
| ද්විතීය මට්ටම | 1020 | 753 | 267 |
| ප්‍රාථමික මට්ටම | 168 | 168 | - |
| වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්) | - | 5 | 5 |
| **එකතුව** | **1242** | **963** | **289** |




**පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - සංවිධාන ව්‍යුහය**

# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

පුත්තලම නගර මධ්‍යයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත.පරිපාලනය විමධ්‍යගත කිරිම යටතේ හා බලය පවරන ලද වෙනත් රාජකාරී ගත් කළ පරිපාලනයේ වැඩි කොටසක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් සිදු කරයි.දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල විවිධ දෙපාර්තමේන්තු වලට අයත් කාර්යාල සංකීර්ණයන් පවත්වාගෙන යනු ලබයි.එනම් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය,සහකාර මැතිවරණ කාර්යාලය,රජයේ විගණන කාර්යාලය,දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය,ඉඩම් පරිහරන කාර්යාලය,ලංකා බැංකු කච්චේරි ශාඛාව,පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය,වයඹ ප්‍රධාන අමාත්‍ය සම්බන්ධීකරණ කාර්යාලය,අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය,ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලය,ආපදා කළමණාකරණ කාර්යාලය,සමාජ ආරක්ෂණ අධිකාරි ශාඛා කාර්යාලය,කුඩා ව්‍යාපාර කාර්යාලය,මොටර් රථ පරික්ෂක කාර්යාලය, සංඛ්‍යාලේඛණ කාර්යාලය සහ රජයේ තැපැල් කාර්යාලයක්ද වේ.

පාලන අංශය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම ආයතනික කටයුතු කරනු ලබන අතර ඊට අමතරව පහත සඳහන් විශාල රාජකාරි කොටසක්ද සිදු කරනු ලබයි.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සාමාන්‍ය පරිපාලනය
- කෘෂිකර්ම කටයුතු
- බෞද්ධ හා සංස්කෘතික කටයුතු
- මාණ්ඩලික නිලධාරීන්ගේ කාර්යය සාධන ඇගයීම්
- සමාජ සේවා කටයුතු
- රණවිරු සුභසාධන කටයුතු
- දුම්රිය බලපත් හා කොස් ගස් කැපීමට බලපත්‍ර ලබාදීම
- මැතිවරණ විෂයට අදාල රාජකාරි
- ප්‍රායෝගික පුහුණු පාඨමාලා සහ භාෂා පුහුණු පන්ති සංවිධානය
- උප්පැන්න,විවාහ,මරණ,රෙජිස්ට්‍රාර්වරුන් හා හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම
- ග්‍රාම නිලධාරීන්ගේ කටයුතු
- සියළුම විනය කටයුතු හා චක්‍රලේඛ ගොනු පවත්වාගෙන යාම
- දිස්ත්‍රික් පරිසර සංවර්ධන කටයුතු
- රජයේ පොදු නිවාස පිළිබඳ කටයුතු
- ඉදිකිරීම් (සංවර්ධන) කටයුතු
- මිල පාලන හා කිරුම් මිනුම් පිළිබඳ කටයුතු
- ධීවර කටයුතු

1996 දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය “ඒ” ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බවට පත්වූ පසු මුලින්ම 625 වැය ඒකකය යටතේද ,2000 සිට 2006 වන තෙක් 837 වැය ඒකකය යටතේද,2007 සිට 273 වැය ඒකකය යටතේද ගිණුම් අංශය වෙනම ඒකකයක් ලෙස ක්‍රියාත්මක වේ.කාර්යයන් ඉටු කිරීමේ පහසුව සඳහා එය ප්‍රධාන අංශ දෙකකට වෙන් කරන ලදී.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගිණුම් ඒකකය
- පාලන ගිණුම් ඒකකය

දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගිණුම් ඒකකය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සියළුම ලැබීම් සහ ගෙවීම් කටයුතු කරනු ලබයි.මීට අමතරව ක්‍රමසම්පාදන,සංඛ්‍යාලේඛණ,සමෘද්ධි,කුඩා ව්‍යාපාර වැනි අනුබද්ධ ආයතන වල ගෙවීම්ද සිදු කරයි.
පාලන ගිණුම් ඒකකය මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මුල්‍ය කටයුතු පිළිබඳව අධීක්ෂණය කරනු ලබයි. එහි කාර්යයන් පහත සඳහන් ආකාරයෙන් සිදු කෙරේ.

- ආදායම්,වියදම් හා අත්තිකාරම් සම්බන්ධව වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා බෙදා හැරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශ ලබාගෙන ඒකාබද්ධ කර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම
- භාණ්ඩාගාර පරිගණක වාර්තා සැසඳීම හා අදාල රේඛීය අමාත්‍යාංශ,දෙපාර්තමේතු වලට යැවීම
- වාර්ෂික විසර්ජන ගිණුම,අත්තිකාරම් ගිණුම හා සියළුම පාලන ගිණුම් පිළියෙල කිරීම
- ගිණි අවි බලපත්‍ර හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර මගින් ආදායම් එකතු කිරීම

2012 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරිත්වය ප්‍රධාන කොටස් 4 ක් යටතේ බෙදා වෙන් කර දැක්විය හැක.

- සාමාන්‍ය පරිපාලනය
- සංස්කෘතික හා සමාජ කටයුතු
- සංවර්ධන කටයුතු
- වාර්ෂික ගිණුම් සාරාංශ

- **සාමාන්‍ය පරිපාලනය**

2012 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයට වෙන් කරන ලද ප්‍රතිපාදන හා ඒ අනුව වැය කරන ලද මුදල් පිළබඳව සාරාංශ සටහනක් පහත දැක්වේ.

## (1) පුනරාවර්ථන වියදම්

| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිවිම |
|---|---|---|---|
| *දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | | | |
| 1.සාමාන්‍ය පරිපාලනය | 85,103,679.00 | 83,539,240.00 | 1,564,439.00 |
| 2.මූලධන වියදම් | 101,800,000.00 | 62,402,006.00 | 39,397,994.00 |
| *ප්‍රාදේශීය ලේකම් කාර්යාල | | | |
| 1. සාමාන්‍ය පරිපාලනය | 358,631,047.00 | 355,631,820.00 | 2,999,227.00 |
| 2. මූලධන වියදම් | 400,000.00 | 354,276.00 | 45,724.00 |

## (2) විශ්‍රාම වැටුප් ගෙවීම

| | | |
|---|---|---|
| 2012 ජනවාරි සිට දෙසැම්බර් දක්වා - | සිවිල්- රු. | 281,508,278.17 |
| | -වැන්දඹු-රු. | 51,596,137.87 |
| | -පළාත් පාලන-රු. | 1,089,050.62 |

## (3) එකතු කළ ආදායම

| | |
|---|---|
| 01. විවිධ බලපත්‍ර ගාස්තු හා තුවක්කු බලපත්‍ර වලින් අයකරන ගාස්තු | -රු. 315,548.00 |
| 02.රජයේ ගොඩනැගිලි කුලී - | රු. 1,364,720.00 |
| 03.රජයේ නිලධාරීන්ට ණය දීමෙන් ලැබෙන කුලී - | රු. 5,771,947.00 |
| 04.දඩ මුදල් හා රාජසන්තක කිරිම් - | රු.11,921,892.00 |
| 05.පරිපාලනාත්මක ගාස්තු - | රු. 2,073,721.00 |
| 06.අනෙකුත් ලැබීම් - | රු.10,052,323.00 |

## (4) අභ්‍යන්තර විගණන කටයුතු

විධිමත් රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පද්ධතියක් ස්ථාපනය කිරිම සඳහා අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරන ලදී.මෙම අංශය ආයතනයේ මුදල් හා ගිණුම් කටයුතු සම්බන්ධව මෙන්ම අනෙකුත් වැඩ හා සේවාවන් ඉටු කිරීමෙන් මෙන්ම පාලනයෙන්ද නිදහස්ව ආයතන ප්‍රධානියාට කෙලින්ම වගකිව යුතුව ඇත.

අභ්‍යන්තර විගණන අංශය මගින් දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවතින අභ්‍යන්තර පාලන ක්‍රමය අධ්‍යයනය කර එමගින් ආයතනයේ සිදුවන වැරදි හා වංචා වැලැක්විම සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරන අභ්‍යන්තර පාලන ක්‍රමය පරීක්ෂා කර එහි විධිමත්භාවය හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණ හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යයි.එමෙන්ම ආයතනයේ සංවර්ධන ව්‍යාපෘතින් යොජනා ක්‍රියාත්මක කිරිම් හා ප්‍රගතිය නිශ්චය කිරිමට ගණන්දිමේ නිලධාරියාට සහයවිම සිදු කරයි.ඒ අනුව 2012 වර්ෂයේ පහත සඳහන් වැරදි සහ අඩුපාඩු අනාවරණය කර ගන්නා ලදී.

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල පැවති අභ්‍යන්තර පාලනයේ අඩුපාඩු සකස් කර ගැනීමට උපදෙස් දෙන ලදී.
- ගෙවීම් වව්චර්වල පැවති අඩුපාඩු නිවැරදි කිරිමට උපදෙස් දෙන ලදී.
- අය නොකරන ලද බලපත්‍ර ගාස්තු පිළිබඳව පෙන්වා දෙන ලද අතර ඒවා නැවත අයකර ගැනිමට කටයුතු කර ඇත.
- පෞද්ගලික ලිපිගොනු හා අනෙකුත් ආයතන කටයුතු වල අඩුපාඩු පෙන්වා දෙන ලදී.
- ධාවන සටහන් හා ඉන්ධන භාවිතය පිළිබඳ අඩුපාඩු පෙන්වා දී ඒවා නිවැරදි කිරිමට උපදෙස් දෙන ලදි.

## (5) මානව සම්පත් සංවර්ධනය

මානව සම්පත් සංවර්ධනය සඳහා පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන නිලධාරීන් විසින් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

| වැඩසටහන | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම |
|---|---|---|
| 1. ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 33 | 14610 |
| 2. අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 115 | 27250 |
| 3. පුද්ගලික අංශයේ රැකියා ගත කිරිම | 60 | 12000 |

| | | |
|---|---|---|
| 4. නිදහස් රැකියා පෙළඹවීමේ වැඩසටහන | 33 | 11460 |
| 5. ස්වයං රැකියා පෙළඹවීමේ වැඩසටහන | 288 | 12690 |
| 6. බාහිර උපාධිධාරී වැඩසටහන | 35 | 16812 |
| 7. රැකියා සමාජ වැඩසටහන | 90 | 62100 |
| 8. වෘත්තීය සැලසුම් ජයගැනීම | 96 | 14630 |

## (6) මාධ්‍ය හා ප්‍රවෘත්ති

දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය මගින් 2012 වර්ෂයේ කරන ලද වැඩසටහන් පහත දැක්වේ.

- ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති පුත්තලම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම වාර්තාව සකස් කිරීම
- පුවත්පත් මණ්ඩලය මගින් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා කරන ලද වැඩමුළුව
- විදේශ සේවා කාර්යාංශය මගින් පැවැත්වූ වැඩමුළුව
- ප්‍රජා විශෝධන වැඩමුළුව
- දෙසතිය සගරාව මගින් පාසල් දරුවන් සඳහා මාධ්‍ය සම්මන්ත්‍රණය
- සමස්ත ලංකා දහම් පාසල් තරග මාධ්‍යය සම්බන්ධීකරණ කටයුතු
- දිස්ත්‍රික් සංවර්ධන කටයුතු පිළිබඳ තොරතුරු ලබා දිම හා පොත් මුද්‍රණය කිරීම හා පොත් සැකසීම
- දේශපාලනය හා වත්මන් මාධ්‍ය භාවිතය / ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය කොයිබටද සම්මන්ත්‍රණ පැවැත්වීම
- අපරාධ හා ජාතික ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය/රසවින්දන වැඩසටහන
- 2012 වර්ෂයේ පුවත්පත් වාර්තා 50 පමණ මාධ්‍යට නිකුත් කිරිම
- විමර්ශන ලිපි සකස් කිරිම
- සියළු මැතිවරණ මාධ්‍යය සම්බන්ධීකරණ කටයුතු
- දිස්ත්‍රික්කයේ සියළු සංවර්ධන කටයුතු සඳහා ප්‍රචාරණයක් ලබාදීමට ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සම්බන්ධීකරණ කටයුතු.
- දිස්ත්‍රික්කයේ පාසල් තුල මාධ්‍ය සංසද පිහිටුවීම
- විවිධ අමාත්‍යාංශ මගින් දැනුම් දෙන වැඩසටහන් වල මාධ්‍ය කටයුතු සංවිධානය කිරිම

## (7) ඉඩම් ලියාපදිංචි කිරිම

ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලය මගින් 2012 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සාමාන්‍ය ඉඩම් ඔප්පු සංඛ්‍යාව 13448 වන අතර ජය භූමි ඉඩම් ඔප්පු සංඛ්‍යාව 220 කි.

## (8) අපදා කළමණාකරණ කටයුතු

දිස්ත්‍රික් ආපදා කළමණාකරණ ඒකකය මගින් 2012 වර්ෂයේ කරන ලද ප්‍රජා මූල දැනුවත් කිරීමේ හා හදිසි ප්‍රතිචාර දැක්වීමේ වැඩසටහන් පහත දැක්වේ.

### සුනාමි පෙරහුරු වැඩසටහන්

| | |
|---|---|
| මුන්දලම පල්ලිවාසල්පාඩුව | 2012.04.26 |
| වෙරළවැල්ල හලාවත | 2012.06.22 |
| නාරක්කල්ලිය කල්පිටිය | 2012.07.20 |
| වට්ටක්කල්ලිය හලාවත | 2012.07.26 |
| මැදතොඩුවාව මහවැව | 2012.08.10 |
| පූනපිටිය මුන්දලම | 2012.08.17 |
| කල්පිටිය මණ්ඩලකුඩාව | 2012.09.17 |
| ඩජ්පේ කල්පිටිය | 2012.09.14 |
| බත්තලන්ගුණ්ඩු කල්පිටිය | 2012.10.19 |

### දැනුවත් කිරීමේ වැඩසටහන්

- වෙලි ආරක්ෂණය ඉගිණිමිටිය ජලාශය නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 10 ක් දැනුවත් කරන ලදී.
- නවගත්තේගම හා කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 5 අලින්ගෙන් වන හානිය පිළිබඳ දැනුවත් කරන ලදී.
- ස්වභාවික ආපදාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පවත්වන ලදී.
- පාසල් ආරක්ෂණය හා දැනුවත් කිරීමේ වැඩසටහන් 18 පැවැත්විම.
- වෙනත් ආයතන දැනුවත් කිරිම හා පුහුණු කිරීමේ වැඩසටහන් 12 ක් පැවැත්වීම.

## ඩෙංගු මර්ධන කටයුතු සඳහා දායකත්වය

| | |
|---|---|
| රාජ්‍ය නිලධාරීන් | 3910 |
| ප්‍රජා දායකත්වය | 8653 |

## විශේෂ සිද්ධීන් හා ක්ෂණික ප්‍රතිචාර දැක්වීමේ කටයුතු

| | |
|---|---|
| වල් අලි ප්‍රහාර | 02 |
| වල් අලි ප්‍රහාර මියයාම් | 01 |
| වල් අලි ප්‍රහාර නිවාස හානි | 01 |
| අකුණු හැසීමෙන් නිවාස හානි | 01 |
| තද සුළං නිවාස හානි | 15 |
| කැලෑ ගිණි ගැනීම් | 08 |

නියඟය නිසා පානිය ජලය බෙදා හැරීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 කි.

ගෑස් කාන්දු වීම 1ක් සිදුවූ අතර සේවකයන් 18 දෙනෙකු රෝහල් ගත කෙරිණි.

| | |
|---|---|
| ජල ගැලීම් නිසා මියයාම් | 02 |
| ජල ගැලීම් නිසා නිවාස හානි | පූර්ණ 330 අර්ධ 694 |

පූර්ණ හානි වු නිවාස සඳහා කූඩාරම් 75 ක් ලබාදීම

## ආපදා අවම කිරීමේ ව්‍යාපෘතීන්

| | |
|---|---|
| ජල ගැලීම් අවම කිරීම රන්දියගම වෙන්නප්පුව | රු. 625000.00 |
| තිබිල්ල ඇල පිළිසකර කිරීම හලාවත | රු. 201062.40 |
| රජගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම හලාවත | රු.1545706.94 |

මුහුද අවට ප්‍රදේශ වල අනතුරු ඇඟවීමේ පුවරු 36 ක් සවි කිරීම

## • සංස්කෘතික හා සමාජ සේවා

**(01) ළමා ආරක්ෂණ කටයුතු**

- ➢ ළමා අපයෝජන අවම කිරීම සඳහා ප්‍රජා නායකයින් දැනුවත් කිරීම
- ➢ ළමා අපයෝජන අවම කිරීම සඳහා කොරගහයාය විහාරස්ථ දායක සභාව දැනුවත් කිරීම
- ➢ ළමා අපයෝජන අවම කිරීම සඳහා ග්‍රාමීය මෙහෙයුම් කමිටු නිලධාරීන් දැනුවත් කිරීම
- ➢ ළමා අපයෝජන අවම කිරීම සඳහා ළමා සභා නියෝජිතයින් දැනුවත් කිරීම
- ➢ ළමා අපයෝජන අවම කිරීම සඳහා රණවිරු සංසද සාමාජිකයන් දැනුවත් කිරීම
- ➢ පාසල් වෑන් රථ රියදුරන් දැනුවත් කිරීම
- ➢ ළමා සභා පිහිටුවීම
- ➢ ළමා කඳවුරු පැවැත්වීම

**(2) සමාජ ආරක්ෂණ කටයුතු**

සමාජ ආරක්ෂණ මණ්ඩලය 2012 වර්ෂයේ ප්‍රගතිය පහත සඳහන්වේ.

| | |
|---|---|
| ❖ නව බඳවා ගැනීම් සංඛ්‍යාව - | 2945 |
| ❖ විශ්‍රාම වැටුප් ලබා ගත් සංඛ්‍යාව - | 184 |
| ❖ විශ්‍රාම වැටුප් මුදල රු. - | 92000/- |
| ❖ වන්දි මුදල් ලබාගත් සංඛ්‍යාව - | 10 |
| ❖ වන්දි මුදල රු. - | 217905/- |

**(3) සමාජ සේවා කටයුතු**

| | |
|---|---|
| ➢ නිවෙස් මට්ටමින් පුනරුත්ථාපනය ආරම්භ කළ සංඛ්‍යාව | 198 |
| ➢ සමාජ ගත කිරීම් | 212 |
| ➢ පෙර පාසල් ගත කළ සංඛ්‍යාව | 66 |
| ➢ සාමාන්‍ය පාසල් වෙත යොමු කළ සංඛ්‍යාව | 55 |
| ➢ විශේෂ පාසල් වෙත යොමු කළ සංඛ්‍යාව | 63 |
| ➢ චිකිත්සක සේවා වෙත යොමු කළ සංඛ්‍යාව | 745 |
| ➢ වෘත්තීය පුහුණු වෙත යොමු කළ සංඛ්‍යාව | 120 |

- ➢ රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව 93
- ➢ ස්වයං රැකියා සඳහා යොමු කළ සංඛ්‍යාව 227
- ➢ සහනාධාර ලබාදුන් සංඛ්‍යාව 1550
- ➢ නිවාසාධාර ලබා දුන් සංඛ්‍යාව 187
- ➢ පැවැත්වූ ස්වේච්ජා සේවක රැස්වීම් 231
- ➢ පැවැත්වූ ස්ව උපකාරක කණ්ඩායම් රැස්වීම් 530
- ➢ මෙහෙයුම් කමිටු රැස්වීම් 148
- ➢ ග්‍රාමීය කමිටු රැස්වීම් 1163
- ➢ නිලධාරින් දැනුවත් කිරිම 112
- ➢ දෙමව්පියන් දැනුවත් කිරිම 145

**(4)** **සංස්කෘතික හා ආගමික කටයුතු**

- ❖ රටට ජාතියට ආරක්ෂක අංශ වලට සෙත්පතා ආනමඩුව වඩත්ත ශ්‍රී සරණංකර පිරිවෙනෙහි සතියක් පුරා පිරිත් සජ්ඣායනාවක් පවත්වන ලදී.
- ❖ රටට ජාතියට ආරක්ෂක අංශ වලට සෙත්පතා ආරච්චිකට්ටුව කරුක්කුලිය ජයතිලකාරාමයෙහි සතියක් පුරා පිරිත් සජ්ඣායනාවක් පවත්වන ලදී.

- <u>සංවර්ධන කටයුතු</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවර්ධන කටයුතු සංවර්ධන අංශය මගින් සිදු කෙරේ.මෙය දිස්ත්‍රික් ඉජිනේරුවරයා යටතේ පවති. 2010 වසරේදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉදි කිරිම් ආරම්භ වූ අතර 2012 වර්ෂයේදි ද එහි ඉතිරි වැඩකටයුතු කරගෙන යන ලද අතර තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක ඉදි කිරිම් කරන ලදි.

| <u>ප්‍රා.ලේ.කා</u> | <u>ඇස්තමේන්තුව රු.</u> | <u>2012 වියදම රු.</u> |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 300,000,000.00 | 36,180,486.00 |
| නාත්තන්ඩිය | 9,046,000.00 | 4,018,441.00 |
| ආරච්චිකට්ටුව | 14,418,000.00 | 4,466,874.00 |

2012 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල වියදම් විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව<br>அமைச்சு/ திணைக்களம்<br>Ministry/ Dept | වැය ශීර්ෂය<br>செலவின தலைப்பு<br>Expenditure Head | ප්‍රාග්ධන<br>மூலதன<br>Capital | පුනරාවර්තන<br>மீண்டுவரும்<br>Recurrent |
|---|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම<br>மாவட்ட செயலகம் – புத்தளம்<br>District Secretariat-Puttalam | 273 | 62,756,282 | 439,171,060 |
| ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ලේකම් කාර්යාලය<br>சிரேஷ்ட அமைச்சர் செயலகம்<br>Secretariat for Senior Ministers | 003 | - | 24,547 |
| මුදල් හා ක්‍රම සම්පාදන<br>நிதி திட்டமிடல்<br>Ministry of Finance Planning | 102 | - | 16,111 |
| ආර්ථික සංවර්ධන<br>பொருளாதார அபிவிருத்தி அ/சு<br>Ministry of Economic Development | 105 | 2,278,113,928 | - |
| ආපදා කළමණාකරණ<br>இடர் முகமைத்துவம்<br>Disaster Management | 106 | 12,950 | 17,634,262 |
| අධිකරණ<br>நீதி அமைச்சு<br>Justice | 110 | - | 1,777,414 |
| කෘෂිකර්ම<br>விவசாய அமைச்சு<br>Ministry of Agriculture | 118 | 2,354,461 | - |
| ළමා සංවර්ධන හා කාන්තා කටයුතු<br>சிறுவர் அபி. பெண்கள் விவகாரம்<br>Child Development & Wome'sn Affairs | 120 | 1,921,360 | 9,401,755 |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු<br>பொது நிர்வாக மற்றும் உள்நாட்டலுவல்கள்<br>Public Administration & Home Affairs | 121 | 4,890,605 | - |

| | | | |
|---|---|---|---|
| සමාජ සේවා අමාත්‍යාංශය<br>சமூக சேவைகள் அ/சு<br>Social Service | 124 | 359,276 | 18,036,000 |
| තාක්ෂණ හා පර්යේෂන<br>தொழிநுட்பவியல் ஆராய்ச்சி அ/சு<br>Technology & Research | 133 | 1,402,213 | 1,047,520 |
| ජාතික භාෂා සමාජ ඒකාබද්ධතා<br>தேசிய மொழிகள் மற்றும்சமூக ஒறுமைப்பாடு<br>National Languages & Social integration | 134 | - | 246,868 |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන<br>கடற்றொழில் நீரியல் வளதுரை அபிவிருத்தி அ/சு<br>Fisheries & Aquatic Resources Development | 139 | 2,842,379 | - |
| වාරිමාර්ග ජල කළමණාකරණ<br>நீர்ப்பாசன நீர் முகாமைத்துவ அ/சு<br>Irrigation & Water Mgmt. | 152 | 1,141,097 | - |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන<br>காணிகள் மற்றும் காணி அபிவிருத்தி அ/சு<br>Land & and Development | 153 | 64,308,617 | 281,588 |
| යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන<br>இளைஞர் விவகார மற்றும் திறன் அபி. அ/சு<br>Youth Affairs & Skill Development | 156 | 1,036,184 | 138,000 |
| පරිසර<br>சுற்றாடல் அ/சு<br>Ministry of Environment | 160 | 25,000 | - |
| සංස්කෘතික හා කලා කටයුතු<br>கலாசார மற்றும் கலை அலுவல்கள் அ/சு<br>Ministry of Culture and the Arts | 177 | 121,371 | - |
| ගොවිජන සේවා හා වනජීවී<br>கமநல சேவை மற்றும் வனஜீவராசிகள் தி/ம்<br>Dept. of Agrarian Services & Wildlife | 179 | - | 62,225 |
| මහජන සම්බන්ධතා හා මහජන කටයුතු<br>மக்கள் தொடர்பாடல் மற்றும மக்கள் விவகார அ/சு<br>Mass Media & Public Relation | 183 | 4,666,471 | - |
| ඵලදායිතා ප්‍රවර්ධන<br>உற்பத்தி திறன் மேம்பாட்டி அமைச்சு<br>Ministry of Productivity Promotion | 181 | 9,875 | - |
| බෞද්ධ කටයුතු පිළිබඳ<br>பௌத்த சமய விவகார அமைச்சு<br>Budhdhasasana & Religious Affairs | 201 | 1,746,380 | 15,558,879 |
| ක්‍රිස්තියානි ආගමික කටයුතු<br>கிறிஸ்தவ சமய அலுவல்கள் அமைச்சு<br>Ministry of Christian Affairs | 203 | 3,763,795 | - |
| සංස්කෘතික හා කලා කටයුතු<br>கலாசார மற்றும் கலை அலுவல்கள் தி/ம்<br>Dept. of Culture & the Art | 206 | - | 215,325 |
| සමාජ සේවා දෙපාර්තමේන්තුව<br>சமூக சேவைகள் தி/ம்<br>Dept. of Social Services. | 216 | - | 4,314,921 |
| පරිවාස හා ළමා ආරක්ෂක සේවා<br>நன்நடத்தை சிறுவர் பாதுகாப்பு சேவைகள் தி/ம்<br>Dept. of Probation and Child Care Services | 217 | - | 6,428,918 |
| සමෘද්ධි කොමසාරිස් ජනරාල්<br>சமுர்த்தி ஆணையாளர் தி/ம்<br>Dept.of the Commissioner Gen. of the Samurdhi | 218 | - | 409,292,731 |
| ආගමන විගමන<br>குடிவரவு குடிஅகழ்வு தி/ம்<br>Dept. of Immigration & Emigration | 226 | - | 20,715 |

| | | | |
|---|---|---|---|
| අධිකරණ<br>நீதி அமைச்சு<br>Ministry of Justice | 228 | 691,416 | - |
| විශ්‍රාම වැටුප්<br>ஓய்வூதிய தி/ம்<br>Dept. of Pensions | 253 | - | 334,569,271 |
| සංඛ්‍යාලේඛණ<br>தொகைமதிப்பு புள்ளிவிபரவியல் தி/ம்<br>Dept. of Census & Statistics | 252 | 19,910,436 | 1,107,304 |
| ගොවිජන සංවර්ධන<br>கமநல அபிவிருத்தி அ/சு<br>Ministry of Agriculture Development | 281 | 18,111,107 | - |
| වනජීවි සංරක්ෂණ<br>வன ஜீவராசிகள் பாதுகாப்பு தி/ம்<br>Dept. of Wildlife Conservation | 284 | 931,730 | - |
| ඉඩම් කොමසාරිස් ජනරාල්<br>காணிகள் ஆணையாளர் நாயகம் தி/ம்<br>Dept. Of Commissioner Gen. of Lands | 286 | 159,875 | - |
| ආහාර<br>உணவு ஆணையாளர் தி/ம்<br>Dept. of Commissioner of Food | 300 | - | 381,262 |
| මෝටර් රථ ප්‍රවාහන<br>மோட்டார் வாகன போக்குவரத்து தி/ம்<br>Dept. of Motor Traffic | 307 | 60,413 | 436,397 |
| ඉඩම් පරිහරන ප්‍රතිපත්ති සැලසුම්<br>காணி உபயோக கொள்கை திட்டமிடல் தி/ம்<br>Dept. of Land Use Planning | 327 | 999,183 | 2,904,008 |
| මිනිස් බල හා රැකී රක්ෂා<br>மனித வலு வேலைவாய்ப்பு தி/ம்<br>Dept. of Man Power & Employment | 328 | 324,597 | 256,285 |

- **<u>වාර්ෂික ගිණුම්</u>**

මේ යටතේ 2012 වර්ෂයේ මෙහෙයුම් වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල වියදම් පිළිබඳ විස්තර එක් එක් ව්‍යාපෘති යටතේ ඩී.ජී.එස්.ඒ.2,3,4,5 ආකෘති මගින් පෙන්වා දෙනු ලබයි. අත්තිකාරම් ගිණුමෙහි සහ තැන්පත් ගිණුමෙහි ආරම්භක ශේෂය වර්ෂය තුල හර සහ බැර කිරිම් පිළිබඳ විස්තර සටහන් ii මගින් හා අග්‍රිම ගිණුම් විස්තර සටහන් iii මගින් පෙන්වා දී තිබේ.

# වැඩසටහන් අනුව විසර්ජන ගිණුම 2012

වියදම් ශීර්ෂ අංකය :273

අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පුත්තලම

වැඩසටහන් අංකය හා නාමය : 1 - මෙහෙයුම් වැඩසටහන

## පුනරාවර්තන හා මූලධන වියදම් සාරාංශය

| වියදමෙහි ස්වභාවය (ඩී.ජී.එස්.ඒ. ආකෘති යොමුව සමඟ) | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ.66 හා 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/(අතිරික්තය) (4-5) | සටහන් අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ. 2ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|
| | රු | රු | රු | රු | රු | රු | |
| (අ) පුනරාවර්තන (ඩී.ජී.එස්.ඒ.3) | 378,500,000 | 65,234,726 | 11,800,000<br>(11,800,000) | 443,734,726 | 439,171,060 | 4,563,666 | 3 |
| (ආ) මූලධන (ඩී.ජී.එස්.ඒ.4) | 102,200,000 | - | 4,500,000<br>(4,500,000) | 102,200,000 | 62,756,282 | 39,443,718 | 4 |
| එකතුව | 480,700,000 | 65,234,726 | - | 545,934,726 | 501,927,342 | 44,007,384 | |

## ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම්

වියදම් ශීර්ෂ අංකය :273

අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පුත්තලම

වැඩසටහන් අංකය හා නාමය : 1 - මෙහෙයුම් වැඩසටහන

| ව්‍යාපෘති අංකය / නම,පුද්ගලික පඩි නඩි සහ සියළුම ව්‍යාපෘති සඳහා අනෙකුත් අයකිරීම් | (1) | (2) | (3) | (4) | (5) | (6) |
|---|---|---|---|---|---|---|
| | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් (+/-) | මු.රෙ.66 හා 69 අනුව මාරු කිරීම් (+/-) | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/(අතිරික්තය) (4-5) |
| | රු | රු | රු | රු | රු | |
| **ව්‍යාපෘති අංකය හා නම - 01 -සාමාන්‍ය පරිපාලනය හා ආයතන සේවා** | | | | | | |
| **දි.ලේ.කා. - පුත්තලම** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 18,800,000 | 56,978,679 | - | 75,778,679 | 75,298,224 | 480,455 |
| අනෙකුත් වියදම් | 9,325,000 | - | - | 9,325,000 | 8,241,016 | 1,083,984 |
| උප එකතුව | 28,125,000 | 56,978,679 | | 85,103,679 | 83,539,240 | 1,564,439 |
| **ව්‍යාපෘති අංකය හා නම - 02 -ප්‍රාදේශීය ලේකම් කාර්යාල** | | | | | | |
| පුද්ගල පඩිනඩි | 311,500,000 | 8,256,047 | 11,000,000<br>(11,000,000) | 319,756,047 | 319,178,716 | 577,331 |
| අනෙකුත් වියදම් | 38,875,000 | - | 800,000<br>(800,000) | 38,875,000 | 36,453,104 | 2,421,896 |
| උප එකතුව | 350,375,000 | 8,256,047 | - | 358,631,047 | 355,631,820 | 2,999,227 |
| ව්‍යාපෘති - 01 | 28,125,000 | 56,978,679 | | 85,103,679 | 83,539,240 | 1,564,439 |
| ව්‍යාපෘති - 02 | 350,375,000 | 8,256,047 | - | 358,631,047 | 355,631,820 | 2,999,227 |
| මුළු එකතුව | 378,500,000 | 65,234,726 | - | 443,734,726 | 439,171,060 | 4,563,666 |

## ව්‍යාපෘති අනුව මූලධන වියදම්

වියදම් ශීර්ෂ අංකය : 273
අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -පුත්තලම
වැඩසටහන් අංකය හා නාමය : 1 - මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘති අංකය හා නාමය : 01 හා 02 - සාමාන්‍ය පරිපාලනය හා දිස්ත්‍රික් පරිපාලනය

| වැය ශීර්ෂ අංකය | අයිතම අංකය | මූලාශ්‍රය(සංකේත අංකය) | අයිතම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66,69 අනුව මාරු කිරීම් පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/(අතිරික්තය) (4-5) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | (1) | (2) | (3) | (4) | (5) |
| | | | | රු | රු | රු | රු | |
| | | | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරිම | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි | 4,000,000 | 4,500,000 | 8,500,000 | 5,010,466 | 3,489,534 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 500,000 | - | 500,000 | 166,935 | 333,065 |
| 2003 | | 11 | වාහන | 1,000,000 | | 1,000,000 | 958,519 | 41,481 |
| | | | **උප එකතුව** | **5,500,000** | **4,500,000** | **10,000,000** | **6,135,920** | **3,864,080** |
| | | | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 5,000,000 | - | 5,000,000 | 1,667,412 | 3,332,588 |
| 2103 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,000,000 | - | 1,000,000 | 287,146 | 712,854 |
| 2104 | | 11 | ගොඩනැගිලි | 90,000,000 | (4,500,000) | 85,500,000 | 54,011,528 | 31,488,472 |
| | | | **උප එකතුව** | **96,000,000** | **(4,500,000)** | **91,500,000** | **55,966,086** | **35,533,914** |
| | | | හැකියා වර්ධනය | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් | 300,000 | - | 300,000 | 300,000 | - |
| | | | උප එකතුව | 300,000 | - | 300,000 | 300,000 | **-** |
| | | | **ව්‍යාපෘති 1 හි එකතුව** | **101,800,000** | **-** | **101,800,000** | **62,402,006** | **39,397,994** |
| | | | හැකියා වර්ධනය | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම් | 400,000 | - | 400,000 | 354,276 | 45,724 |
| | | | **උප එකතුව** | **400,000** | **-** | **400,000** | **354,276** | **45,724** |
| | | | **ව්‍යාපෘති 2 හි එකතුව** | **400,000** | **-** | **400,000** | **354,276** | **45,724** |
| | | | **ව්‍යාපෘති 1 හි හා 2 හි මුළු එකතුව** | **102,200,000** | **-** | **102,200,000** | **62,756,282** | **39,443,718** |

# වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

(පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් වල ඓක්‍යය)

වියදම් ශීර්ෂ අංකය : 273
අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම

| මූල්‍යකරණය | | වැඩසටහන 1 | | වැඩසටහන 2 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ශුද්ධ ප්‍රතිපාදනය | සත්‍ය වියදම | වියදමේ ප්‍රතිශතය (6÷5)X100 |
| | | රු | රු | රු | රු | රු | රු | |
| 11 | දේශීය අරමුදල් | 545,934,726 | 501,927,342 | - | - | 545,934,726 | 501,927,342 | 92% |
| 12 | විදේශීය ආධාර - ණය | | | | | | | |
| 13 | විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ණය | | | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කල හැකි විදේශීය ආධාර - ප්‍රදාන | | | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | | | |
| 17 | විදේශාධාර සම්බන්ධ දේශීය අරමුදල් | | | | | | | |
| 21 | විශේෂ නීති සේවා | | | | | | | |
| | එකතුව | 545,934,726 | 501,927,342 | - | - | 545,934,726 | 501,927,342 | 92% |

**අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2012**

වියදම් ශීර්ෂ අංකය - 273 අමාත්‍යාංශයේ /දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම

| අත්තිකාරම් /තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය * | දෙපාර්තමේන්තුවේ පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත අනුව 2012/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2012/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුල හර කිරීම් | වර්ෂය තුල බැර කිරීම් | 2012/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු | රු | රු | රු | රු |
| I.රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 273011 | 149,033,060.81 | 33,037,076.08 | 36,842,108.06 | 145,228,028.83 | 145,228,028.83 |
| | 273012 | | 13,291,823.23 | 17,455,996.55 | 4,164,173.32 | 4,164,173.32 |
| | | 149,033,060.81 | 46,328,899.31 | 54,298,104.61 | 141,063,855.51 | 141,063,855.51 |
| II.අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III.විවිධ අත්තිකාරම් | | | | | | |
| IV.තැන්පත් | | | | | | |
| I. පොදු තැන්පත් | 6003/0000/00/0019/0000/000 | | | | | |
| ii. අනෙකුත් තැන්පත් | 6003/0000/00/0049/0000/000 | 142,241,288.99 | 205,183,556.28 | 328,484,393.60 | 265,542,126.31 | 265,542,126.31 |

මු.රෙ.506 (2) ප්‍රකාර ඉහත සඳහන් අත්තිකාරම් ගිණුම්වල හා තැන්පත් ගිණුම්වල අවසාන ශේෂය ,පුද්ගල ගිණුම්වල අදාල ලැයිස්තු සමඟ සසඳා ,එම සැසඳුම් ප්‍රකාශය විගණකාධිපති වෙත වාර්තා කල බවට තහවුරු කරමි.

**අග්‍රිම ගිණුම් පිළිබඳ සාරාංශ වාර්තාව - 2012**

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම
වියදම් ශිර්ෂ අංකය : 273

| දෙපාර්තමේන්තු පොත් අනුව | | | | | 2012/12/31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය රු: |
|---|---|---|---|---|---|
| ගිණුම් අංකය | 2012/01/01 දිනට ආරම්භක ශේෂය රු: | වර්ෂය තුල මුළු හර කිරිම් රු: | වර්ෂය තුල මුළු බැර කිරිම් රු: | 2012/12/31 දිනට අවසාන ශේෂය රු: | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| 7002/0/0/312/11 | - | 3,815,093,565.18 | 3,815,093,565.18 | - | |

1. ඉහත 5 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න.
   (1)ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2012.12.31 දිනට මුදල් ශේෂය ................................
   (2) වෙනත් හේතු-
.................................................. ................................

2. ඉහත 5 හි දැක්වෙන ශේෂයෙහි සංයුතිය පහත සඳහන් පරිදි විස්තර කරන්න.
   (1) නොපියවූ උප අග්‍රිම (අත්තිකාරම් එකතුව)
(2) ගිණුම් සාරාංශ සැකසීමේ දෝෂ (ඇතොත්) ..............................

-

මෙම ශේෂයන් වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බවද,නොඑසේනම් නොපියවීමට හේතු සඳහන් කරන්න.
**ආණමඩුව ප්‍රාදේශීය ලේකම්ගේ විදේශ ගමන් වියදම් අත්තිකාරම්**